සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

වාර්ෂික වාර්තාව 2017/2018

කෘෂිකර්ම අමාත්‍යාංශය

දැක්ම

"එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කර ගනිමින් පෝෂ්‍යදායී පොස්පරස් මගින් අපගේ මාතෘභූමිය සාරවත් පසකින් සාරවත් කිරීම"



මෙහෙවර

"පරිසර හිතකාමී සහ නව ක්‍රමවේදයන් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සැපිරීම"

පටුන

- අධ්‍යක්ෂ මණ්ඩලය 01
- සංස්ථාපිත තොරතුරු 02
- මූල්‍ය ඉස්මතු කිරීම් 03
- සභාපතිතුමාගේ ප්‍රකාශනය 04-05
- ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 06
- කළමනාකරුවන් 07
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 08-11
- විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 12
  - විගණකවරුන්ගේ වාර්තාව 13-15
  - විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 16
  - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 17-18
  - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 19
  - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 20-21
  - වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 22-29
  - මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සටහන් 30-37
- මෙහෙයුම් සමාලෝචනය 38-40
- රැස්වීම් වාරය දැනුම්දීම 41
- පෙරකලාසියේ ආකෘතිය 42

අධ්‍යක්ෂ මණ්ඩලය

උපාලි ඒ.දිසානායක මහතා
සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ

ආර්.එන්.කේ.රණවීර මහතා
විධායක අධ්‍යක්ෂක

සී.එච්.එස්.පුල්ලේපෙරුම මිය
අධ්‍යක්ෂිකා

පී.එච්. හඳුන්හේවා මිය
අධ්‍යක්ෂිකා

ඒ.එම්.එම්.බණ්ඩා මහතා
අධ්‍යක්ෂක

එම්.ආර්.ඥානතිලක මහතා
අධ්‍යක්ෂක

සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය

සී/ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10 වන දින සීමිත වගකීමක් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද්දේ, රාජ්‍ය කැනීම් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය, 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය පවරා ගන්නා ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ නමුත් 2007 අංක 7 දරණ සමාගම් ආඥා පනත යටතේ මෙකී සමාගම නැවත ලියාපදිංචි කරනු ලැබ ඇත.

මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

බහු වාර්ෂික කෘෂි භෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැනීම්, සැකසුම සහ අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

ලියාපදිංචි අංකය

පී.බී. 308

අධ්‍යක්ෂ මණ්ඩලය

යූ.ඒ.දිසානායක මහතා - සභාපති

ආර්.එන්.කේ.රණවීර මහතා - විධායක අධ්‍යක්ෂක

ඩී.එච්.එස්.පුල්ලේපෙරම මහත්මිය - අධ්‍යක්ෂිකා

පී.එච්.හඳුන්හේවා මහත්මිය -අධ්‍යක්ෂිකා

ඒ.ඒ.එම්.බණ්ඩා මහතා - අධ්‍යක්ෂක

එම්.ආර්.ඥාණතිලක මහතා - අධ්‍යක්ෂක

සමාගමේ ලේකම්

සී/ස මූල්‍ය සේවා සහ වෙළඳ නියෝජිත පුද්ගලික සමාගම,
300/3, නාවල පාර, නාවල.

අවසාන මව් සමාගම

ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්ට මෙම සමාගමේ නිකුත් කළ කොටස් සම්පූර්ණයෙන්ම අයිතිව ඇත.

රේඛීය අමාත්‍යාංශය

කෘෂිකර්ම අමාත්‍යාංශය,

නො : 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

ලියාපදිංචි කාර්යාලය

අංක 73 1/1, නව කැළණි පාලම පාර,
කොළඹ 14.
දුරකථන අංකය - 94112459906/7
ෆැක්ස් අංකය - 94112459908

විගණකවරු

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නො : 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

බදු උපදේශකවරු

අමරසේකර සහ සමාගම
වරලත් ගණකාධිකාරවරු,
නො.12 - රොටුන්ඩා උද්‍යානය,
කොළඹ 03.

බැංකුකරුවන්

ලංකා බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

මූල්‍ය ඉස්මතු කිරීම්

වර්ෂය සඳහා (රුපියල් '000)

	2017/18	2016/17	2015/16	2014/15	2013/14
ආදායම	493,551	366,094	562,735	530,431	499,969
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)	25,305	(10,534)	26,587	100,089	134,385
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	17,610	(14,577)	29,578	101,173	131,662

වර්ෂ අවසාන දිනට (රුපියල් '000)

	2017/18	2016/17	2015/16	2014/15	2013/14
කොටස්කරුවන්ගේ අරමුදල	755,348	740,738	760,315	760,737	694,564
කාරක ප්‍රාග්ධනය	505,418	442,665	451,108	411,167	492,724
මුළු වත්කම්	843,086	836,113	860,451	844,245	766,140
කාර්ය මණ්ඩල පිරිවැය	230,782	224,678	236,020	192,571	162,284
සේවක සංඛ්‍යාව (ගණන)	333	335	347	339	285

කොටසකට

	2017/18	2016/17	2015/16	2014/15	2013/14
ඉපැයීම් (රු.)	2.43	(2.01)	4.08	13.95	18.53
ශුද්ධ වත්කම් (රු.)	104.17	102.15	104.86	104.91	95.79

අනුපාතයන්

	2017/18	2016/17	2015/16	2014/15	2013/14
ජංගම අනුපාතය **(වාර)**	13.14	7.90	7.41	8.91	14.06
කොටස්කරුවන්ගේ අරමුදලට ප්‍රතිලාභ (%)	2.33%	-1.97%	3.89%	13.2%	19.3%

සභාපතිවරයාගේ පණිවිඩය

දැනට හඳුනාගෙන ඇති ෆොස්පේට් නිධි ඉදිරි වසර 50 ඇතුළත ක්‍ෂය වෙනු ලබන අතර, ඉතිරි සංචිත ඉදිරි වසර 100 කට පමණ පදනම් වේ. මෙය අප සතුව ඇති වටිනා ෆොස්පේට් නිධි සම්පත් වලින් අප කරන්නා වූ ද පිළිබඳ ශුභදායී දක්මක් වේ. භූ විද්‍යා සමීක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් 1971 අප්‍රේල් මස 04 වන දින එප්පාවල ෆොස්පේට් නිධිය සොයා ගනු ලැබීය. මෙම නිධිය මෙට්‍රික් ටොන් මිලියන 60 කින් සමන්විත ව අතර උතුරු ප්‍රදේශයේ මෙට්‍රික් ටොන් මිලියන 40 ක්ද දකුණු ප්‍රදේශයේ මෙට්‍රික් ටොන් මිලියන 20 ක්ද වේ. මෙය මුහුදු මට්ටමින් මීටර 200 ක් වන කඳු පන්ති 6 කට මුහුණලා පවතින අතර හෙක්ටයාර 324 ක භූමි ප්‍රමාණයක් පුරාවට පැතිරී තිබේ. ලෝකයේ පොහොසත්ම සහ අසමසම එක්තරා පොස්පේට් නිධියක් ලෙසට සලකන 33% - 40% ක පමණ P_2O_5 අඩංගු මෙම ඛනිජ පසෙහි මෙට්‍රික් ටොන් මිලියන 60 ක් පමණ ඇති බවට තක්සේරු කොට ඇත.

රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් වලට පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ කොන්දේසි යටතේ පොස්පේට් සමාගම 1992 ජුලි මස 10 වන දින සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීමටය. මෙම සමාගමෙහි සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්තුමා සතුවෙයි. 1998 නොවැම්බර් මස බෝගල ග්‍රැපයිට් ආයතනයේ වෙන්වීමත් සමඟ ලංකා පොස්පේට් සමාගම සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් බවට පත්විය.

වර්තමානයේ සමාගම විසින් එප්පාවල රොක් පොස්පේට් (ERP) සහ අධි – ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) යනුවෙන් වර්ග දෙකක් නිපදවනු ලබන අතර මේවා ශ්‍රී ලංකාවේ බහු භෝග සඳහා පොහොර ලෙස භාවිතා කරනු ලැබේ. මීට අමතරව සමාගම විසින් පොල් පොහොර මිශ්‍ර කිරීමේ යන්ත්‍රාගාරයක් 2014 වර්ෂයේ සිට වාරියපොළ, කනත්තේ වැව පවත්වාගෙන යයි. කෙසේ වෙතත් මෙම නිධිය තුළින් ජාතිය සඳහා උපරිම ප්‍රතිලාභයක් ලබාදීම වෙනුවෙන් කටයුතු පුළුල් කිරීමට ආයතනයට හැකියාව ඇත.

වර්තමානයේ අප වාර්ෂිකව එප්පාවල රොක් පොස්පේට් මෙ. ටො. 60,000 ක් පමණ නිපදවන අතර එම ප්‍රමාණයම රටේ වැවිලි භෝග අංශය සඳහා අලෙවි කරනු ලබයි. අපගේ පොහොර තේ, රබර්, පොල්, පළතුරු භෝග සහ අපනයන මුදල් භෝග සඳහා භාවිතාකරනු ලබයි. තේ වගාව සඳහා එප්පාවල රොක් පොස්පේට් වලින් **60%** ක ප්‍රමාණයක්ද රබර් සහ පොල් සඳහා **30%** ක ප්‍රමාණයක්ද මෙයින් භාවිතා කරනු ලැබේ.

ඉතිරි 10% අපනයන මුදල් භෝග සහ පළතුරු භෝග සඳහා භාවිතා කරනු ලබයි. අපගේම පොහොර වර්ගයක් භාවිතා කිරීම තුළින් රටට රුපියල් මිලියන 1,500 ක පමණ වාර්ෂික විදේශ විනිමයක් ඉතිරි කිරීමට හැකියාව ලැබේ.

2017/2018 න් අවසන් ගිණුම් වර්ෂයේදී දළ ආදායම රුපියල් මිලියන 493.5 ක් වූ අතර එය පසුගිය වසර හා සසඳන විට (සතුටුදායක වැඩිවීමකි). තවද, ලංකා ෆොස්පේට් සමාගම විසින් විකුණුම් මට්ටම් අත්පත් කරගනු ලැබුවේ එප්පාවල රොක් ෆොස්පේට් පොහොර (ERP) මෙට්‍රික් ටොන් 37,760.85 ක් ද උසස් තත්ත්වයේ එප්පාවල රොක් ෆොස්පේට් පොහොර (HERP) මෙට්‍රික් ටොන් 8388.96 ක්ද පොල් පොහොර (APM/YPM) මෙට්‍රික් ටොන් 576.12 ක්ද වශයෙනි.

එප්පාවල පොස්පේට් නිධියේ උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට අදාළව පවත්නා හා නව ව්‍යාපාරික අවස්ථා දියුණු කිරීමට සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය බැඳී සිටී. රටේ සමස්ථ කෙටි කාලීන බෝගවලට අවශ්‍ය වඩාත් ගැලපෙන පොස්පේට් වර්ග, ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) සහ සිංගල් සුපර් පොස්පේට් (SSP) ලෙස ජාතික අවශ්‍යතාවය සහ වැදගත්කම අප හඳුනාගෙන තිබේ.

වගකීමක් ඇති රජයේ ආයතනයක් ලෙස ලංකා පොස්පේට් සමාගම, වටිනාකම් එකතු කරන ලද නිෂ්පාදන, මානව හිතවාදී පරිසර හා කාර්යමණ්ඩල පුහුණුවීම් වැඩ සටහන් වලට ප්‍රමුඛත්වය දෙමින් සේවකයන්ගේ කුසලතාවයන් හා හැකියාවන් සෑම අංගයකින්ම වැඩි දියුණු කිරීමට අපි එකතුවී වැඩ කරන්නෙමු.

අවසාන වශයෙන්, මා විසින් මේ සම්බන්ධයෙන් අප වෙත මහ පෙන්වීම, ධෛර්‍ය්‍ය සහ සහයෝගය ලබාදෙන කෘෂිකර්ම අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයට සහ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩළයට මාගේ ප්‍රණාමය පුදකරමි.

ලංකා පොස්පේට් සමාගමට එහි ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.



සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ
සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

එච්. ආර්. යූ. ඩී. බණ්ඩාර
සාමාන්‍යාධිකාරී

යූ. එස්. පී. පී. සූරියආරච්චි
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

පී. ඒ. චන්ද්‍රදාස
නිෂ්පාදන කළමනාකරු

ඩී. පී. යූ. චාමර
මූල්‍ය කළමනාකරු

එස්.ඩී.රූපසිංහ
මෙහෙයුම් කළමනාකරු

කළමනාකරුවන්

කපිතාන් කේ.පී.ආර්.පී.කිරිඇල්ල
ආරක්ෂක කළමනාකරු

ඩී. ආර්. කේ. තිලකරත්න
ගණකාධිකාරී

එම්. එම්. ඩී. තිලකරත්න
අභ්‍යන්තර විගණක

ආර්. ඒ. ඒ. පී. රණසිංහ
අලෙවි විධායක

එච්.ඒ.ටී.ජයනන්ද
යාන්ත්‍රික ඉන්ජිනේරු

එස්. ඒ. අබේසිරි
සැපයුම් නිළධාරි

එස්.එම්.ඒ.ආර්.කේ. මංචනායක
පරිපාලන නිළධාරි
(පරිපාලන හා මානව සම්පත්)

ඩී.ආර්.ගුණරත්න
කර්මාන්තශාලා නිළධාරි

ආර්.එම්.මද්දුමබණ්ඩාර
සැපයුම් නිළධාරි

ඩී. එස්.එම්.දිසානායක
ගබඩා නිළධාරී

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස ලංකා පොස්පේට් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ විගණනය කරන ලද ගිණුම් සහ 2018 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරයි.

1.0 <u>සමාගමේ නම</u>

සී/ස ලංකා පොස්පේට් සමාගම (ලි.ප.අ. PB 308)

2.0 <u>පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය</u>

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජුලි 10 වන දින සංස්ථාගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබීය.

3.0 <u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය</u>

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදුකිරීම, සකස් කිරීම හා අලෙවි කිරීම හා පොල් පොහොර මිශ්‍ර කිරීම.

4.0 <u>මූල්‍ය ප්‍රකාශනය</u>

මේ සමඟ අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනයෙන් වාර්තා කරන දිනට සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී

මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගනිමින් ඒවාට අනුරූපව සාධාරණව සහ ඒකාකාරිව නිගමන හා තක්සේරුකරණයන් සිදු කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැති බව ඔවුන්ගේ අදහසයි. සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් වත්කම්වල සුරක්ෂිතභාවය රැක ගැනීමටත්, වංචා සහ අනෙකුත් අවිධිමත් කටයුතු වලක්වාගැනීමට සහ අනාවරණය කරගැනීමටත් පියවර ගෙන ඇත.

5.0 <u>මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්</u>

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගණුදෙනු නිසි ලෙසට පෙන්නුම් කිරීමට සාධාරණව ඥාණාන්විතව සහ තක්සේරු තීරණවලට එළැඹීම සඳහා සුදුසු අනුරූපීය ගිණුම්කරණ පිළිවෙත් භාවිතයට ගෙන ඇත. ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ ගිණුම්කරණ පිළිවෙත්වල කිසිදු වෙනසක් සිදු නොවීය.

6.0 දේපළ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ඒවායේ තක්සේරු කිරීම සහ ක්ෂයවීම

මෙම වර්ෂය තුල දේපළ, යන්ත්‍රෝපකරණ හා උපකරණවල ප්‍රාග්ධන වියදම රුපියල් 2,718,545.20 ක් ලෙස සමාගම විසින් ලබාදී ඇත.

එකී දේපළ හා යන්ත්‍රෝපකරණ වල තත්ත්වය හා වෙනස්වීමේ පිළිබඳ විස්තර ඒවායේ තක්සේරු අගය, ක්ෂයවීමේ පිළිබඳ විස්තර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 5 යටතේ දක්වා ඇත.

7.0 බදුකරණය

නිරීක්ෂණය කරන වර්ෂය තුල මෙම සමාගම බදු අයකළ හැකි ආදායමෙන් 28% ක බද්දකට යටත් වෙයි.

8.0 ලාභාංශ

නිරීක්ෂණය කරන වසර ඇතුළත අතුරු ලාභාංශ ප්‍රකාශයට පත්කර නොමැත.

9.0 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රුපියල් 72,510,000/- සාමාන්‍ය කොටස් 7,251,000 කින් සමන්විත වේ. නිරීක්ෂණයට භාජනය කරන වසර ඇතුලතද ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් නොවීය.

10.0 කොටස් හිමිකාරීත්වය

පොදු සංස්ථා හෝ රජයට අයිතිව ඇති පවරා ගන්නා ලද ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ 2(3) වගන්තිය යටතේ සමාගමේ එකම කොටස්කරු වනුයේ රජය වෙනුවෙන් (රාජකාරි මට්ටමින්) භාණ්ඩාගාර ලේකම්ය.

2018 මාර්තු 31 දිනට සමාගමේ කොටස් හිමිකාරීත්වය පිළිබඳ විස්තර පහත සඳහන් වන පරිදිවේ.
භාණ්ඩාගාර ලේකම්ට (රාජකාරි මට්ටමින්) සාමාන්‍ය කොටස් 7,251,000 කි.

සී/ස GSMB ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙක් වන සී/ස ලංකා පොස්පේට් සමාගම සාමාන්‍ය කොටස් 100,000 ක හිමිකාරත්වය දරයි. (එකක් රු.10/- බැගින්)

මෙම හිමිකාරත්වය දැරීමේ ප්‍රතිශතය 16.66% කි.

11.0 කොටස් හිමිකාරත්වයේ වෙනස්වීම

සමාගමේ කොටස් හිමිකාරත්වයේ කිසිදු වෙනස්වීමක් 2018 මාර්තු 31 දින වන විට සිදුවී නැත.

12.0 සංස්ථාපිත සමාජ වගකීම

නිරීක්ෂණය කරන වර්ෂය ඇතුලත සමාගම විසින් පුණ්‍ය කටයුතු හා සමාජ වගකීම කටයුතු සඳහා රුපියල් 495,187.00 ක් යොදවා ඇත.

13.0 සේවකයින්

වර්ෂය ඇතුලත සම්පූර්ණ සේවක මණ්ඩල පිරිවැය රුපියල් 230,782,595.00 කි.

වර්ෂය අවසානය වන විට සමාගම විසින් සේවයේ යොදවා ඇති සාමාන්‍ය සේවක සංඛ්‍යාව 333 ක් වේ.

14.0 අධ්‍යක්ෂකවරුන්

සමාලෝචිත වසර ඇතුලත පහත සඳහන් අය අධ්‍යක්ෂ තනතුරු දැරිය.

යූ.ඒ.දිසානායක මහතා - සභාපති
ආර්.එන්.කේ.රණවීර මහතා - විධායක අධ්‍යක්ෂක
එස්.ඒ.සී.කුලතිලක මහත්මිය - අධ්‍යක්ෂිකා
ජී.අයි.ජී.පෙරේරා මහතා - අධ්‍යක්ෂක
ඩී.එච්.එස්.පුල්ලෙපෙරුම මිය - අධ්‍යක්ෂිකා
ඒ.ඒ.එම්.බණ්ඩා මහතා - අධ්‍යක්ෂක
අයි.එම්.හෙට්ටිආරච්චි මහතා- අධ්‍යක්ෂක
එම්.ආර්.ඥාණතිලක - අධ්‍යක්ෂක
පී.එච්.හඳුන්හේවා මහත්මිය - අධ්‍යක්ෂිකා

15.0 අධ්‍යක්ෂකවරුන් පත්වීම හා ඉල්ලා අස්වීම

එස්.ඒ.සී.කුලතිලක මහත්මිය - අධ්‍යක්ෂිකා (14.08.2017) සහ අයි.එම්.හෙට්ටිආරච්චි මහතා අධ්‍යක්ෂක (30.11.2017) මෙම වසර තුළ ඉල්ලා අස්වුවා ජී.අයි.ජී.පෙරේරා මහතා- අධ්‍යක්ෂක (14.08.2017) සහ ඩී.එච්.එස්.පුල්ලෙපෙරුම මහත්මිය - අධ්‍යක්ෂ (19.03.2018) 2017/18 වසර තුළ අලුතින් පත්විය. කෙසේ හෝ පෙරේරා මහතාද මෙම වසර තුළ ඉල්ලා අස්විය. (19.03.2018)

16.0 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සමාලෝචිත වර්ෂය ඇතුලත රුපියල් 4,334,541.78 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ගාස්තු හා වියදම් වශයෙන් ගෙවා ඇත.

17.0 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනීමේ සහ විශ්වාසය අනුව රජයට, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම නිවැරදිව සහ නියමිත දිනට කර ඇත.

18.0 අනුකූලවීම

මෙම සමාගම ශ්‍රී ලංකාවේ හෝ අන්තැනකට අදාල නීතිරීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීමේ කටයුතුවල නියැලී නොමැත.

19.0 අඛණ්ඩ බව

සමාගමේ මෙහෙයුම් කටයුතු ඉදිරි අනාගත කාලයක් දක්වා පවත්වා ගෙන යැමට ප්‍රමාණවත් සම්පත් ව්‍යාපාරය සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටින අතර ඒ අනුව සමාගමේ සෑම මූල්‍ය ප්‍රකාශනයක්ම අඛණ්ඩත්වයේ පදනම මත පිලියෙල කර ඇත.

20.0 සංස්ථාපිත පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය හොඳ සංස්ථාමය පාලනයක් සහතික කර ඇත. පොදු ව්‍යාපාරයක් වශයෙන් කොටස්රුවන්ගේ අපේක්ෂා සහ අරමුණු මෙන්ම සමාගමේ අරමුණු වලට සමාන්තරව එහි කාර්යසාධනය පවත්වාගෙන යැම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

21.0 අවදානම් කළමනාකරණය

සමාගම විසින් නීතිමය අවදානම අඩු කිරීම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහතික කිරීම සඳහා ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවයන් ඉටුකර ඇත.

22.0 විගණකයින්

සමාගමේ වර්තමාන විගණකවරු ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව (රාජ්‍ය විගණකවරු) කටයුතු කරයි.

2018 සැප්තැම්බර් මස 20 වන දින නොː 73 1/1, නව කැළණි පාලම පාර, කොළඹ 14 යන ලිපිනය දරන ලංකා පොස්පේට් සමාගමේ ප්‍රධාන කාර්යාලයේදී සවස 3.30 ට පැවැත්වූ වාර්ෂික මහා සභා රැස්වීමේ තීරණය අනුව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ, 2018/2019 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව. (රාජ්‍ය විගණකවරු) නැවත පත්කිරීමට ලංකා පොස්පේට් සමාගමේ අධ්‍යක්ෂවරු සමාගමේ කොටස්හිමියන්ට නිර්දේශ කිරීමට තීරණය කරන ලදී.

නව විගණකයින්ගේ පාරිශ්‍රමිකය සම්බන්ධව තීරණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය පැවරිය යුතු බවට යෝජනා කරන යෝජනාවක්ද වාර්ෂික මහා සභා රැස්වීමේදී සලකා බැලීමට කටයුතු කොට ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා 2018 මාර්තු 31 දිනට සමාගම විසින් සපයන ලද මුලු විගණන ගාස්තුව රුපියල් 400,000 ක් විය. බදු උපදේශන සේවා සැපයීම වෙනුවෙන් අමරසේකර සහ සමාගමට වර්ෂය සඳහා රුපියල් 246,432/- ක මුදලක් ගෙවන ලදී.

සභාපති

අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස පරිදි මෙම සමාගම හෝ එහි අනු සමාගම් සමඟ හෝ විගණකයින්ගේ ස්වාධීනත්වයට බලපෑමක් වන ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් නොවීය.

අධ්‍යක්ෂක

FINANCIAL SERVICES AND COMMERCIAL AGENCIES (PRIVATE) LIMITED
COMPANY SECRETARIES TO LANKA PHOSPHATE LIMITED

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්:

සමාගම් ලේකම්වරු

විගණක සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම විගණන සහ කළමනාකරණ කමිටුව පත් කරන ලද අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුය. භාණ්ඩාගාරය වෙනුවෙන් පත් කර ඇති අධ්‍යක්ෂක මෙම කමිටුවේ සභාපති ධුරය දරයි. රේබිය අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා හා තවත් විධායක නොවන අධ්‍යක්ෂවරයකු කමිටුවේ අනික් සාමාජිකයන් වන අතර විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරි වරයෙක් හා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

කලින් ඉදිරිපත් වී තිබු ගැටළු සාකච්ඡා කිරීමට, කළමනාකරණ හා විගණක කමිටුව වර්ෂය තුළ සිව්වතාවක් රැස්විය. කමිටුව විසින්, අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ලබා දීම සඳහා අභ්‍යන්තර විගණක විසින් භාරදෙන කාර්තුමය වාර්තා හා පවත්නා පාලන විධි ඇගයීමට ලක් කරන ලදී.

නිගමනය

වාර්තාව සියුම් ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති හා මෙහෙයුම් පාලන විධි හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා බලපාන වැදගත් ගැටළු නිවැරදි කිරීමට කමිටුව විසින් උපදෙස් දෙන ලදී. තවද සමහර වැදගත් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ලට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරන ලදී.

අත්සන

සභාපති

විගණන සහ කළමනාකරණ කමිටුව

සී/ස ලංකා පොස්පේට් සමාගම

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } අයිඑම්යූ/ඒ/එල්පීඑල්/06/17/12

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 04 දින

සීමාසහිත ලංකා පෝස්පේට් සමාගමේ

කොටස්හිමිකරුවන් වෙත,

සීමාසහිත ලංකා පෝස්පේට් සමාගමේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

සීමාසහිත ලංකා පෝස්පේට් සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම්

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන පිරිවැය රු.106,561,153 ක්වූ වත්කම් අයිතම 09 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද, ඒවායේ ඵලදායි ආර්ථික පැවැත්ම සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන මගින් ජංගම නොවන වත්කම්වල සාධාරණ අගය නිරූපනය නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඇතැම් ගොඩනැගිලි, විදුලි උපකරණ සහ පිරියත සහ යන්ත්‍රවල ඉදිරියට ගෙන එන වටිනාකම සමාගමේ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුව බිංදුව විය යුතුය. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම වත්කම්වල ඉදිරියට ගෙන එන අගය රු.14,198,924 ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඇතැම් ගොඩනැගිලි, විදුලි උපකරණ සහ පිරියත සහ යන්ත්‍රවල පිරිවැය ඉක්මවා රු.10,458,896 කින් ක්ෂය සඳහා වෙන් කිරීම් සිදුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජංගම නොවන වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ අවසානයේ විවිධ වත්කම්වල වටිනාකම වැරදි ගණනය කිරීම් හේතුවෙන් රු.917,410 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2017/2018 වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීමේදී වියදම් වැරදි ලෙස හඳුනාගැනීම හේතුවෙන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වර්ෂයට අදාල බදු වෙන්කිරීම රු.4,100,596 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැයකරන ලද රු.346,601 ක ප්‍රාග්ධන වියදම්, ප්‍රාග්ධනිත කිරීම වෙනුවට පුනරාවර්ථන වියදම් ලෙස සලසා තිබුණි. එබැවින් මූල්‍ය

ප්‍රකාශනවල දැක්වෙන වර්ෂයට අදාල ලාභය සහ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොස්ජේට් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මඟින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) ඉහත මතය සඳහා පදනම, විෂය පථය සහ සීමාවන්

(ආ) මා දරන්නාවූ මතය

- තත්ත්වාගණනය කළ මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා ලබාගත් අතර මා විසින් සිදුකරන ලද පරීක්ෂාවෙන් පෙනී යන පරිදි, සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල වේ.

වාර්ෂික වාර්තා සභාගත කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

සී/ස ලංකා පොස්පේට් සමාගම
2018 මාර්තු මස 31 වන දිනෙ අවසන් වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	2017/2018 රුපියල්	2016/2017 රුපියල්
ආදායම	5	493,551,238	366,093,921
විකුණුම් පිරිවැය		(296,818,870)	(248,209,748)
දළ ලාභය		196,732,368	117,884,173
වෙනත් ආදායම්	6	51,863,371	48,868,248
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්		(3,560,858)	(2,699,064)
කර්මාන්තශාලා හා පරිපාලන වියදම්		(204,872,991)	(193,907,231)
මූල්‍ය පිරිවැය		(1,482,609)	(2,153,976)
බදු වලට පෙර ලාභය	7	38,679,281	(32,007,850)
බදු වියදම	8	(13,373,636)	21,473,920
වර්ෂය සඳහා ලාභය		25,305,645	(10,533,931)
අනෙකුත් විස්තීර්ණ ආදායම්			
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණන ප්‍රතිලාභය		(7,695,396)	(4,043,346)
වර්ෂය සඳහා මුළු අනෙකුත් විස්තිර්ණ ආදායම්		(7,695,396)	(4,043,346)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		17,610,249	(14,577,276)
කොටසක ඉපැයුම	9	3.49	(1.45)

පිටු අංක 01 සිට 26 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මුල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මෙම මුල්‍ය ප්‍රකාශන වලටම අයත් මෙහිම කොටසකි.

සී/ස ලංකා පොස්පේට් සමාගම
2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	31.03.2018 රුපියල්	31.03.2017 රුපියල්
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	295,044,771	328,289,853
කොටස්වල ආයෝජනය	11	1,000,000	1,000,000
විලම්භිත බදු		-	-
		296,044,771	329,289,853
ජංගම වත්කම්			
තොග	12	107,773,553	117,155,141
වෙළඳ ලැබිය යුතු දෑ		19,218,334	36,620,814
තැන්පතු, ඉදිරියට කළ ගෙවීම සහ වෙනත් ලැබිය යුතු දෑ	13	149,480,346	115,075,809
කෙටිකාලින තැන්පතු	14	236,738,858	216,555,893
මුදල් සහ මුදල් සමාන දෑ	15	33,830,528	21,415,764
		547,041,619	506,823,420
මුළු වත්කම්		843,086,390	836,113,273
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	16	72,510,000	72,510,000
රඳවා ගත් ලාභ		682,837,812	668,227,563
මුළු හිමිකම්		755,347,812	740,737,563
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	17	37,066,377	31,217,517
විලම්භිත බදු	18	9,048,249	9,048,249
		46,114,626	40,265,766
ජංගම වගකීම්			
වෙළඳ ගෙවිය යුතු දෑ		11,393,570	13,848,472
ගෙවිය යුතු ආදායම් බදු	19	4,875,371	(3,112,078)
අනිකුත් ගෙවිය යුතු දෑ හා උපචිත වියදම්	20	25,355,010	44,373,550
බැංකු අයිරා		-	-
		41,623,951	55,109,944
මුළු හිමිකම් හා වගකීම්		843,086,390	836,113,273

සමාගමෙහි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලය 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට සහතික කරමි.

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.

මූල්‍ය කළමනාකරු

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂක **අධ්‍යක්ෂක**

2018 ජූලි 20 වන දින

පිටු අංක 01 සිට 26 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලටම අයත් මෙහිම කොටසකි.

සී/ස ලංකා පොස්පේට් සමාගම
2018 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත කළ ප්‍රාග්ධනය රුපියල්	රඳවාගත් ඉපැයුම් රුපියල්	මුළු හිමිකම් රුපියල්
2016 අප්‍රේල් 01 දිනට ශේෂය	72,510,000	687,804,840	760,314,840
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)		(10,533,931)	(10,533,931)
වෙනත් විස්තීර්ණ ආදායම		(4,043,346)	(4,043,346)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණන ලාභ/(අලාභ)			
කොටස්කරුවන් සමග වූ ගණුදෙනු			
ලාභාංශ ගෙවීම		(5,000,000)	(5,000,000)
2017 මාර්තු 31 දිනට ශේෂය	72,510,000	668,227,563	740,737,563
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)		25,305,645	25,305,645
වෙනත් විස්තීර්ණ ආදායම		(7,695,396)	(7,695,396)
නිශ්චිත ප්‍රතිලාභ මත ආයුගණන ලාභ/(අලාභ)			
කොටස්කරුවන් සමග වූ ගණුදෙනු			
ලාභාංශ ගෙවීම්		(3,000,000)	(3,000,000)
2018 මාර්තු 31 දිනට ශේෂය	72,510,000	682,837,812	755,347,812

පිටු අංක 01 සිට 26 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලටම අයත් මෙහිම කොටසකි.

සී/ස ලංකා පොස්පේට් සමාගම
2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	31.03.2018 රුපියල්	31.03.2017 රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
බදු වලට පෙර ලාභය / (අලාභය)		38,679,281	(32,007,850)
ගැලපීම්,			
ක්ෂයවීම		33,660,940	31,013,079
ස්ථාවර වත්කම් ඉවත්කිරීම		-	(1,000,000)
ඉවත් කල වත්කම් වලින් ලද ලාභය		-	(596,720)
විශ්‍රාමික පාරිතෝෂික බැඳීම්		5,791,136	5,669,205
පොළී ආදායම්		(50,950,768)	(45,880,335)
ලාභාංශ ආදායම්		(800,000)	(200,000)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)		**26,380,589**	**(43,002,641)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම			
තොග (වැඩිවීම)/අඩුවීම		9,381,588	9,441,818
වෙළඳ ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		17,402,480	(467,193)
තැන්පතු, ඉදිරියට කළ ගෙවීම සහ ලැබිය යුතු අනිකුත් දෑ(වැඩිවීම)/අඩුවීම		(34,404,537)	(17,795,591)
වෙළඳ ගෙවිය යුතු දෑ (අඩුවීම)/වැඩිවීම		(2,454,903)	3,924,610
උපචිත වියදම් හා වෙනත් ගෙවිය යුතු වියදම් (අඩුවීම)/වැඩිවීම		(19,018,539)	19,547,871
අපහායනය සඳහා වෙන්කිරීම		2,302,687	2,302,687
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		**(410,635)**	**(26,048,438)**
ගෙවූ ආදායම් බදු/ආර්ථික සේවා අයකිරීම/රඳවාගැනීමේ බදු		(5,386,187)	(8,263,982)
ගෙවූ විශ්‍රාමික පාරිතෝෂික		(7,637,671)	(8,207,172)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(13,434,493)**	**(42,519,592)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම		(2,718,545)	(58,129,136)
ඉවත් කල වත්කම් වලින් ලද මුදල්		-	1,349,950
රක්ෂණ හිමිකමට ලද මුදල්		-	1,767,092
කෙරීගෙන යන ප්‍රාග්ධන නොනම් වැඩ වැඩිවීම		-	32,921,897
කෙටිකාලින තැන්පතුවල ආයෝජනය		50,950,768	17,275,422
ලැබුණු පොළී		(20,182,966)	45,880,355
ලැබුණු ලාභාංශ		800,000	200,000

ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**28,849,257**	**41,265,580**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය			
ගෙවූ ලාභාංශ		(3,000,000)	(5,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම් වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(3,000,000)**	**(5,000,000)**
මුදල් හා මුදල් සමාන දෑ වල වර්ෂය තුළ සිදු වූ ශුද්ධ වෙනස්වීම		**12,414,764**	**(6,254,011)**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	21.1	21,415,764	27,669,774
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	21.2	**33,830,528**	**21,415,764**

පිටු අංක 01 සිට 26 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලටම අයත් මෙහිම කොටසකි.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1. සංස්ථාපිත තොරතුරු

1.1 පොදු තත්ත්වය

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ පනතට අනුව සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත අනුව 1992 ජූලි 10 වන දින සංස්ථා ගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇති අතර, ශ්‍රී ලංකාව තුළ පවතී.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 14, නව කැළණි පාලම පාරේ, අංක 73 1/1 දරණ ස්ථානයෙහිද, පාෂාණමය පොස්පේට් (ඇපටයිට්) නිධිය එප්පාවලද පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම සිදු කිරීම, සකස් කිරීම, හා පාෂාණ අලෙවි කිරීමයි. මීට අමතරව සමාගම විසින් පොහොර මිශ්‍ර කිරීමේ මෙහෙයුම් ක්‍රියාවලියක් 2014 වර්ෂයේදී වාරියපොළ කනත්තේවැවදී ආරම්භ කරන ලදී.

1.3 නිකුත් කිරීම සඳහා අනුමැතිය දුන් දිනය

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2018 ජූනි 20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය දෙන ලදී.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සමඟ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන්වල සාරාංශ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS සහ SLFRS) වලට අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත.

2.2 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අඩංගු පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත.

– විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලබයි.
– නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත බැඳියාව (වගකීම) එහි වර්තමාන වටිනාකමට හඳුනාගනු ලබයි.
– සමාගමට ආදායම් උත්පාදනය කරන්න භාවිතා කරන ලද පොස්පේට් තැන්පතුවේ වටිනාකම විශ්වාසවන්ත ලෙස මිණුම් කිරීමට නොහැකි වූ බැවින් වත්කමක් වශයෙන් මූල්‍ය වාර්තාවල හඳුනාගෙන නොමැත.

2.3 ඉදිරිපත් කිරීමේ සහ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල්

සමාගමේ ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ලෙස ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. සියලුම මූල්‍ය ප්‍රකාශන ආසන්නම රුපියලට වැටයූ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

2.4 සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂවල ගිණුම්කරණ ප්‍රතිපත්ති (LKAS 01) - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයට අනුව අඛණ්ඩව යොදාගෙන ඇත.

2.5 ප්‍රමාණාත්මකබව හා ඒකරාශි කිරීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 01) ප්‍රමිතියට අනුව සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන තුළ වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

ස්වභාවය හා ශ්‍රිතය සමාන නොවන අයිතමද ප්‍රමාණාත්මක නම් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

මුල්‍ය වත්කම් හා මුල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කිරීම පහත අවස්ථාවලදී පමණක් සිදුකල හැකියි.

එහි හඳුනාගත් වටිනාකම හිලව් කිරීමට නිත්‍යානුකූලව බලාත්මක කල හැකි අයිතියක් තිබීම.

එහි ශුද්ධ පදනමක් මත පියවීමේ අභිප්‍රායක් තිබීම.

සමකාලීන ලෙස වත්කම් හා වගකීම් උපලබ්ධි කිරීම.

ගිණුම්කරණ ප්‍රමිත හෝ අර්ථකථන මගින් අවශ්‍ය වන විට හෝ අවසර ලබාදෙන විට හෝ ගිණුම් ප්‍රතිපත්තීන් වල නිශ්චිතව අනාවරණය කළ විට හෝ හැර ආදායම් හා වියදම් ආදායම් ප්‍රකාශනය තුළ හිලව් කිරීම කළ නොහැක.

3 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තුගත කිරීම් සහ උපකල්පනයන්

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනාගතයට අදාල යම් යම් තීරණාත්මක ගිණුම්කරණ උපකල්පනවල භාවිතය අවශ්‍යවේ. තවදුරටත්, සමාගමේ කළමනාකරණය විසින් වාර්තාකරණ කාලය අවසානයේදී අදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්වල අනාවරණය කිරීම්වල වටිනාකම් වාර්තා කිරීමට බලපාන විනිශ්වයන් ඇස්තමේන්තු ගත කිරීම් හා උපකල්පන ඇතිකර ගැනීමට අවශ්‍ය වේ.

කෙසේ වුවද උපකල්පන හා ඇස්තමේන්තු ගත කිරීම් පිළිබඳව අවිනිශ්චිතතාවයන් හේතුවෙන්, අනාගත කාල පරිච්ඡේදය තුළ වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපීම් කිරීමට සිදු වන ප්‍රතිඵල ලැබිය හැකිය. එම නිසා සැබෑ පළපුරුද්ද හා ප්‍රතිඵලය මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස්විය හැකිය.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුලත් කිරීමේ ක්‍රියාවලියේදී මුල්‍ය ප්‍රකාශන තුළ වටිනාකම් හඳුනාගැනීමේදී වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇතිකරන පහත සඳහන් විනිශ්චයන්, තක්සේරු හා උපකල්පන කළමනාකරණය විසින් ගනු ලබයි.

a) බදුකරණය

සමාගම අදායම් බදු සහ අනෙකුත් බදු වලට යටත්වේ. ප්‍රවර්ථන බද්ද, විලම්භිත බද්ද සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදනයන් නිශ්චය කිරීමේදී ප්‍රමාණාත්මක විනිශ්චයන් අවශ්‍ය වන අතර, මේ සඳහා මුල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව අවශ්‍ය ගැලපීම් කිරීමේදී සහ බදු නිශ්චය කිරීම සඳහා බදු වන ලාභය ගණනය කිරීමේදී විසඳුම් ලැබීමට ඇති බදු නිර්දේශයන්ද අදාළ කරගත යුතුය. මෙම මුල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේදී අදාළ වන බදු නීතීන් හි අර්ථකතනයන් පිළිබඳව යම් යම් අවිනිශ්චිතතාවයන් පැවතිණි.

සමාගම වර්තමාන, විලම්භිත සහ වෙනත් බදු සඳහා වත්කම් හා වගකීම් හඳුනාගනුයේ අතිරේක බදු පවතීද යන තක්සේරුව මත වේ. අවසාන බදු ප්‍රතිඵලයේ වගකීම මූලික සටහන් වලින් වෙනස්වීමේදී, එම වෙනස තීරණය කරන ලද කාලපරිච්ඡේදය තුළ ආදායම්, විලම්භිත සහ බදු වටිනාකමට බලපානු ලබයි.

b) දේපළ සහ උපකරණ වල ඵලදායි ජීවිත කාලය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකම සුන්බුන් අගය, ඵලදායි කාලය හා වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය විමර්ශනය කරයි. කළමනාකරණයේ විනිශ්චයන් මත වටිනාකම් අනුපාත ක්‍රම භාවිතා කරනු ලබන අතර එමනිසා ඔවුන් අවිනිශ්චිතාතාවයන්ට යටත්වේ.

c.) අඛණ්ඩ පැවැත්ම

සමාගම විසින් සමාගමේ පවත්වාගෙන යාමේ හැකියාව නොහොත් අඛණ්ඩ පැවැත්ම තක්සේරු කරනු ලබන අතර ව්‍යාපාරය අනාගත අවිනිශ්චිත කාලයක් අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය සම්පත් තිබේද යන්න පිළිබඳවද සලකා බලයි.

තවදුරටත් ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙසට දිගින් දිගටම පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සාධාරණ සැකයක් ජනිත විය හැකි කිසියම් වූ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයට දැනීමක් නොමැත. එසේ හෙයින් සමාගමේ ක්‍රියාකාරකම් නවතා දැමීමට හෝ ඇවර කිරීමට අදහසක් නොමැත.

එමනිසා මුල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ලබයි.

d) ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

2018 මාර්තු 31 දින ප්‍රතිඵලයට ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් වාර්තා වී නොමැත.

e) මුල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

විස්තීරණ අදායම් ප්‍රකාශය තුල හානිකරණ අලාභ වාර්තා කිරීම සඳහා යම්කිසි හරයාත්මක සාක්ෂි පවතීද යන්න පිළිබද සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිරන්තරව සමාගම විසින් ඇගයීමක් සිදු කරයි.

f) විකිණීම සඳහා පවතින ආයෝජනවල හානිකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස හඳුන්වන කොටස් අරමුදලට ලබා දී ණය හානිකරණය වී ඇතිද යන්න විමර්ශනය කරයි.

මේ සඳහා ණය සහ තැන්පතුවල තනි අගයන් සඳහා යොදාගත් තක්සේරු කිරීම සමාන විය යුතුය.

g) විලම්භිත බදු වත්කම්

විලම්භිත බදු වත්කම් හඳුනාගනුයේ යම් ප්‍රමාණයකට භාවිතා නොකල බදු අලාභ සහ බදු බැර පවතින බදු අයකළ හැකි ලාභයට එරෙහිව භාවිතා කළ හැකිනම් පමණි. සුදුසු කාලය සහ අනාගත බදු සැලසුම් උපාය මාර්ග සමඟ එක්ව පවතින පදනම මත හඳුනාගත හැකි විලම්භිත බදු වත්කම් සඳහා සැළකිය යුතු කළමණාකරණ විනිශ්චයන් අවශ්‍යවේ.

h) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල ප්‍රමිත වට්නාකම ධාරණ අගය තීරණය කරනු ලබන්නේ ආයුගණක උපකල්පන සලකා බලන සූත්‍රයක් භාවිතා කරමින්ය. මෙහි අනාගතයේ සිදුවන සත්‍ය සංවර්ධනයන්ගෙන් වෙනස් විය හැකි විවිධ උපකල්පනයන් ඇතුළත් කිරීම මෙයට ඇතුළත් වේ.

මෙහි ඇතුලත් වනුයේ වට්ටම් අනුපාතවල නිර්ණය කිරීම් අනාගත වැටුප් වැඩිකිරීම්, මරණ අනුපාතය යනාදියවේ. අගය කිරීමේ සංකීර්ණතාවය, පාදකවූ උපකල්පන හා එහි දිගු කාලීන ස්වභාවය හේතු කොටගෙන මෙම උපකල්පන වල වෙනස්වීම නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකදී ඉතා සංවේදී වේ. සියළුම උපකල්පන සෑම වාර්තාකරන දිනයකදීම නිරීක්ෂණය කරනු ලබයි. යෝග්‍ය වට්ටම් අනුපාත තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව බලාපොරොත්තුවන කාලයට යෝග්‍යවන තක්සේරු කරන කල්පිරීම සමග ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කරණ ප්‍රතිලාභ කළමනාකරණය විසින් සලකා බලනු ලබයි. සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය සහ අනාගත අපේක්ෂිත උද්ධමන අනුපාතය මත අනාගත වැටුප් වැඩිවීම තීරණය කරයි.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම විසින් යොදාගනු ලබන සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත සඳහන් වේ.

විශේෂයෙන් සඳහන් නොවන්නේ නම්, පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අඛණ්ඩව සියළුම කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදාගනු ලබයි.

4.1 ආදායම් හඳුනාගැනීම

4.1.1 භාණ්ඩ විකුණුම්

සමාගම අදායම් හඳුනාගනු ලබන්නේ එම ආදායමේ සහ ඒ ආශ්‍රිතව දැරූ හෝ දරන ලද පිරිවැය වට්නාකම විශ්වාසනීයව හඳුනාගත හැකි විටදී සහ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලාඒමේ හැකියාව ප්‍රත්‍යක්ෂ විටදී පමණි. ආදායම මිනුම්කරණය කරනු ලබන්නේ ලද හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවෙ සාධාරණ වට්නාකමින් වෙළඳ වට්ටම් සහ විකුණුම් මත බදු අඩුකල අගයටයි.

පහත සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ කරන විට භාණ්ඩ විකුණුම් වලින් ආදායම හඳුනාගනී.

a) විකුණනු ලබන භාණ්ඩ වලට අදාල සියළුම අවදානම් හා ප්‍රතිලාභයන් ගැණුම්කරු වෙත මාරුවනු ලබන අවස්ථාවේදී
b) ආයතනය තවදුරටත් අයිතිය සම්බන්ධ කළමනාකරණ මැදිහත් වීමක් හෝ භාණ්ඩ විකිණීම මත ඵලදායි පාලනයක් රඳවාගෙන නොමැති වීම.
c) ආදායමේ වට්නාකම විශ්වාස කළ හැකි ලෙස මැනිය හැකි වීම සහ ගනුදෙනුව හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා එන බව, ප්‍රත්‍යක්ෂ වූ විටදී : සහ
d) ගනුදෙනුවට අදාලව දැරූ පිරිවැය හෝ දරනු ලබන පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකිවීම.

4.1.2 පොළී ආදායම

පොළී ආදායම හඳුනාගනු ලබන්නේ සඵලදායි පොළී අනුපාතය ක්‍රමය භාවිතාකොට ගෙනය (EIR).

4.1.3 ලාභාංශ ආදායම

ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ ලාභාංශ ලැබීමේ අයිතිය ලද විට, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල උපචිත පදනමටය.

4.1.4 වෙනත් ආදායම

වෙනත් ආදායම් උපචිත පදනමට හඳුනාගනු ලබයි.

4.2 වියදම් හඳුනාගැනීම

දැරූ පිරිවැය සහ විශේෂිත අයිතමයක ආදායම් ඉපැයීම් අතර ඍජු සම්බන්ධයේ පදනම මත වියදම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

ව්‍යාපාරය කරගෙන යාමෙදි ඇතිවන සියලුම වියදම් සහ දේපළ, පිරියත උපකරණ ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම තුල ඇතිවන අයකර ගැනීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයතුල හඳුනාගනී. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුනින්, සමාගමේ කාර්‍යසාධනයේ සාධාරණ අගය ඉදිරිපත් කිරීමේ පදනම මත “වියදම් ශ්‍රිත”, ක්‍රමය පවත්වාගෙන යයි.

ආදායම් බදු වියදම් තුළ ජංගම හා විලම්භිත බදු ඇතුලත්වේ. ආදායම් බදු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

4.3 බදු

4.3.1 ජංගම බදු

ජංගම බදු වත්කම් හා වගකීම් තුල ප්‍රවර්ථන වර්ෂය සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාලගෙන් අයවියයුතු හෝ ගෙවියයුතු සහ පෙර වසර සඳහා ගැලපීමක් සිදු කළ යුතු නම් එය ඇතුළත් වේ. වාර්තාකරණ දිනට නීතිගත කර ඇති හෝ ඊට පසුව නීතිගත කර ඇති බදු නීති සහ බදු අනුපාත යොදා ගනිමින් වටිනාකම ගණනය කරනු ලබයි.

4.3.2 විලම්භිත බදු

විලම්භිත බදු වෙන්කරනු ලබන්නේ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා බදුවල ධාරණ අගය සහ වත්කම් සහ වගකීම් වල බදු පදනම අතර වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදාගනිමින්ය.

සියළුම අඩුකළ හැකි වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනී. භාවිතා නොකරන බදු බැර වල ඉදිරියට ගෙනයාම සහ භාවිතා නොකළ බදු අලාභ යම් ප්‍රමාණයකට අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් පවතින බදු අයකල හැකි ලාභයට එරෙහිව ලබාගත හැකි බව හෝ භාවිතා නොකළ බදු අලාභ හා භාවිතයට නොගත් බදු ගෙවීම් භාවිතා කල හැකි විය යුතුයි.

සෑම වාර්තාකරණ දිනකටම විලම්භිත බදු වත්කමේ ධාරණ අගය විමර්ශනය කරනු ලබන අතර, විලම්භිත බදු වත්කමේ මුළ අගය හෝ කොටසක් ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයෙන් තවදුරටත් යම් ප්‍රමාණයක් දක්වා අඩුකරනු ලබයි. හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයකම නැවත අගය කරනු ලබන අතර, අනාගත බදු අයකළ හැකි ලාභය, විලම්භිත බදු වත්කම ආවරණය කර ගැනීමට ඉඩදේ නම්, තවදුරටත් යම් ප්‍රමාණයකට හඳුනාගත හැකිය. විලම්භිත බදු වත්කම් හා වගකීම්, නීතිගත කරන ලද හෝ පසුකාලිනව නීතිගත කරන ලද, බදු නීතිරීති සහ බදු අනුපාතවලට අනුව වත්කම් හඳුනාගැනීම හෝ වගකීම් නිරාකරණය කරගත් විට, වර්ෂය තුළ යොදාගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයට අගය කරනු ලබයි.

4.4 මූල්‍ය නොවන වත්කම'

4.4.1 දේපළ සහ උපකරණ

හඳුනාගැනීම සහ මැනීම

වත්කම් ආශ්‍රිතව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ගලා ඒමේ ප්‍රවණතාවක් පවතී නම් සහ වත්කමේ පිරිවැය LKAS 16 දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව විශ්වාසදායීව මැනිය හැකිවිට දේපළ සහ උපකරණ හඳුනාගනු ලබයි. මූලිකවම දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට මිණුම් කරයි.

පිරිවැය ආකෘතිය

දේපළ සහ උපකරණ දෛනික සේවා පිරිවැයන් සහ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන වටිනාකම අඩුකර පිරිවැයට ප්‍රකාශ කරනු ලබයි. හඳුනාගන්නා ලද උපමානයන් හමුවුනහොත් ප්‍රතිස්ථාන පිරිවැය එම පිරිවැය දැරුවිට එම පිරිවැය තුළ ඇතුලත් කරයි.

පසුකාලින පිරිවැය

පසුකාලීන පිරිවැය ඇතිවනුයේ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ හෝ වත්කම් ඉපැයීමේ හැකියාව වර්ධනය කිරීමේ අදහසින් පසුකාලීනව දරන ලද ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම්, දිර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම් වන අතර, මේවා ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ. එවැනි වියදම් වත්කමේ ධාරණ අගය තුළ හඳුනාගනී. දේපළ, පිරියත උපකරණ වල දෛනිකව ඇතිවන සේවාවල පිරිවැය ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනියි.

ක්ෂයවීම්

සරල මාර්ග ක්‍රමය භාවිතා කොට දේපළ සහ උපකරණ වල පිරිවැය සුන්බුන් අගය දක්වා ඵලදායී ජීවිතකාලය පුරා ලියා හරිමින් ක්ෂයවීම් ගණනය කරයි. මිලදී ගැනීමේ දිනයේ සිට අත්තිකාරම් පදනම මත ඉවත් කිරීම දක්වා ක්ෂය වීම සිදුකරයි.

ඉඩම් ක්ෂය නොකරයි.

වත්කම් වර්ගය	ක්ෂය ප්‍රතිශතය (%)
ගොඩනැගිලි	4
ඉඩම් වැඩි දියුණු කිරීම	5
යන්ත්‍ර හා පිරියත	10
රසායනාගාර උපකරණ	10
විදුලි උපකරණ	10
විවිධ වත්කම්	10
මෝටර් වාහන	20
කාර්යාල උපකරණ	20
ලීබඩු හා සවිකිරීම්	20
පරිගණක දෘඩාංග හා මෘදුකාංග	20

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම දේපළ, පිරියත හා උපකරණවල සුන්බුන් අගය, ඵලදායී ජීවිතාකාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය සළකා බලන

අතර ඒ සඳහා සංශෝධනයක් අවශ්‍ය නම් සිදුකරනු ලබයි.

ප්‍රති හඳුනා ගැනීම

දේපළ හා උපකරණ භාවිතා කිරීමෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නම් ඒවා හඳුනා නොගනී. වත්කම් ප්‍රති හඳුනා ගැනීම මත ඇති වන ලාභය හෝ අලාභය (ශුද්ධ විකුණුම් වටිනාකම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරයි) වත්කම් ප්‍රති හඳුනා ගැනීම වර්ෂය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනාගනු ලබයි.

4.4.2 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සමාගම විසින් සෑම ගිණුම් කාලච්ඡේදයක් අවසානයේදීම එහි වත්කම්හි හානිකරණය සිදුකිරීම සඳහා ඇඟවීමක් ඇත්ද යන්න පිළිබද විවරණයක් සිදු කරයි. කිසියම් ඇඟවීමක් පවතින්නේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් අවශ්‍යවන විට, සමාගම විසින් වත්කමේ නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

4.5 මෙහෙයුම් බදු

කල්බදු හිමියා විසින් කල්බදු කාලය පුරා අයිතියේ ප්‍රතිලාභ සහ සියළුම පසුකාලින අවදානම් ඵලදායීව රඳවා ගනී නම් එවැනි බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරයි. මෙහෙයුම් කල්බදු ගෙවීම කල්බදු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට වියදමක් ලෙස හඳුනාගැනීම හෝ කල්බදු වත්කම් භාවිතා කිරීමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ගලාඑන කාල පිළිවෙලේ නිරූපණය මත හඳුනාගනු ලබයි.

4.6 තොග

සාමාන්‍ය තොග අගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් වලින් අඩු අගයට ප්‍රකාශ කරයි. නිෂ්පාදන පිරිවැය මත පදනම්ව හරිත සාමාන්‍ය පදනම මත පිරිවැය හඳුනාගනී. පොස්පේට් තොග අගය කරන විට නිධි පිරිවැයෙන් 40% ක්ද ඇඹරුම් (සකස් නොකළ) නිෂ්පාදනයටද ඉතිරි 60% ක් සකස් කළ නිෂ්පාදනයටද විභජනය කිරීම භාවිතයේ පවතී. ශුද්ධ උපලබ්ධි අගය වනුයේ පිරිවැය උපලබ්ධි කිරීම සඳහා අවසර දීමෙන් පසුව, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට තබා ඇති තොගවල මිල ගණන් අනුවය. යල්පැනගිය, මන්ද සංචලන සහ දෝෂ සහිත තොග සඳහා අවශ්‍ය වෙන්කිරීම් සිදුකරනු ලබයි.

4.7 මූල්‍ය වත්කම් හඳුනාගැනීම සහ මැනීම

4.7.1 මුල්වරට හඳුනාගැනීම

සියළුම මූල්‍ය වත්කම් මුල්වරට හඳුනා ගත යුත්තේ ගණුදෙනුව මුල්වරට උත්පාදනය කල දිනයේදීය. උදාහරණ වශයෙන් සමාගම මූල්‍ය උපකරණයක ගිවිසුම් ගත වෙන්කිරීමකට පාර්ශවයක් බවට පත් වූ දිනය. මෙය තුළ "නිතිපතා වෙළඳාම" ඇතුලත්වේ. තවද මෙය තුළ වෙළඳ පළ තුළ නීති හෝ සම්මුති මගින් පොදුවේ පිහිටුවන කාලපරාසයක් තුල වත්කම් බෙදාහැරීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීමද ඇතුලත් වේ.

4.7.2 මුල්වරට මැනීම

මුල්වරට හඳුනාගන්නා මූල්‍ය උපකරණ වර්ගිකරණය පදනම් වනුයේ ඒවායේ අරමුණු මත සහ ගුණාංග සහ ඒවා අත්පත්කර ගැනීමට කළමනාකරණය දරණ අරමුණු මතයි. සියළුම මූල්‍ය උපකරණ මුල්වරට මනිනු ලබන්නේ මූල්‍ය වත්කම්වල ගනුදෙනු පිරිවැය සහ ලාභ අලාභ අතරින් සාධාරණ අගයට හඳුනාගත් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හැර ගනුදෙනු පිරිවැය ඇතුලත්ව එහි සාධාරණ අගයට වේ.

4.7.3 පසුකාලිනව මැනීම

ලාභය හෝ අලාභය, හරහා සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්, කල් පිරීමට තබා ඇති ආයෝජන, ණය සහ ලැබිය යුතු දෑ සහ විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ග කෙරෙන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, පසුකාලීනව අගය කරයි.

4.7.4 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය

යම් යම් කාරණා යටතේ මුලික හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය අනුව වාර්තාවන ව්‍යුත්පන්නයන් (FVTPL) ලෙස හඳුනාගත් ඒවා හැර, ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලබයි.

- වෙළඳාම සඳහා පවතින වර්ගය තුළ සහ විකිණීම සඳහා පවතින, ණය සහ ලැබිය යුතු දෑ හෝ කල්පිරීමට තබා ඇති වර්ගය.

- "විකිණීම සඳහා පවතින, වර්ගය තුළ සහ "ණය සහ ලැබිය යුතු දෑ," "වෙළඳාම සඳහා පවතින වර්ගය, තුලට හෝ "කල්පිරීමට තබා ඇති, දෑ තුල පවතින දෑ.

නැවත වර්ගීකරණය වාර්තාකරණුයේ නව ක්‍රමක්ෂය පිරිවැය ලෙසට ඇතිවූ නැවත වර්ගිකරණය කල දිනයේ සධාරණ අගයට වේ. විකිණීම සඳහා පවතින ඒවා තුල මුල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම සඳහා සඵල පොළි අනුපාතය භාවිතාකරමින් ආයෝජන පවතින ජීවිතකාලය පුරා ලාභ අලාභයට ක්‍රමක්ෂය ලෙස හිමිකම තුළ වත්කමේ පෙර වාසිය හා අලාභ හඳුනාගනී. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර යම් වෙනසක් පවතින විට සඵල පොළි අනුපාතය භාවිතා කරමින් වත්කමේ පවතින ජීවිතකාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි.

වත්කම හානිකරණය කිරීමට පසුව තීරණය කලහොත් හිමිකම් ගිණුම තුළ ඇතුළත් කර තිබු ප්‍රමාණය ආදායම් ප්‍රකාශයට නැවත ඇතුළත් කළ යුතු වේ.

- වෙළඳාම සඳහා පවතින වර්ගීකරණය තුළ සහ ණය සහ ලැබිය යුතු දෑ වර්ගීකරණය තුලට නැවත වර්ගීකරණය කරනුයේ, ව්‍යාපාරය අනාගතයේ අවිනිශ්චිත කාලයක් සඳහා මුල්‍ය වත්කම තබාගැනීමට හැකියාව හෝ කල්පිරෙන තුරු තබා ගැනීමේ අරමුණ පැවතීම.

මුල්‍ය වත්කම නැවත වර්ගීකරණය, සහ සමාගම එම මුදල් ලැබීමේ නැවත අයකර ගැනීම්වල ඉහළයාමක් ලෙස අනාගත මුදල් ලැබීම තක්සේරු කර පසුකාලීනව වැඩිවේ නම් එම ඉහළයාමෙ' බලපෑම තක්සේරු කළ වෙනස්කමේ දිනයේ සිට සඵලපොළි අනුපාතයට ගැලපීමක් ලෙස හඳුනාගනී.

නැවත වර්ගීකරණය කිරීම කළමනාකරණයේ තෝරාගැනීම මත වේ. එමෙන්ම අයිතමයෙන් අයිතමය මත තීරණය කරනු ලබයි.

4.7.5 මුල්‍ය වත්කම් ප්‍රති හදුනා ගැනීම

මුල්‍ය වත්කම් (මුල්‍ය වත්කමක ඇතුලත් විය හැකි කොටසක් හෝ සමාන මුල්‍ය වත්කමක සමාගමේ කොටසක් හෝ) පහත අවස්ථාවලදී හඳුනානොගනී.

– කල් ඉකුත්වූ වත්කමක මුදල් ගැලීම් ලැබීමේ අයිතිය කල් ඉකුත් වු විට

– සමාගම සතු වත්කමක මුදල් ගැලීම් ලැබීමට ඇති අයිතිය මාරු කිරීම හෝ ප්‍රමාණාත්මක ප්‍රමාදයක් නැතිව තුන්වන පාර්ශවයකට සම්පූර්ණයෙන්ම ලැබු මුදල් ගැලීම් ගෙවීමට බැඳියාවක් උපකල්පනය කර තිබීම. එසේ නැතහොත්,

- වත්කමක සියළු අවදානම් සහ ප්‍රතිලාභ පසුකාලීනව මාරුකර තිබීම

- සමාගම වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ මාරු කිරීමක්ද රඳවාගැනීමක්ද නොකර ඇති නමුත් වත්කමේ පාලනය මාරු කර තිබීම.

සමාගම විසින් වත්කමක මුදල් ගැලීම් ලැබීමට ඇති අයිතිය මාරුකර තිබෙන විට හෝ සංස්ථාපනය විනිවිද යාමක් ඇතුලත් කර තිබීම සහ මාරු කර නොමැති වීම හෝ වත්කමක සියළුම අවදානම් සහ ප්‍රතිලාභ පසුකාලීනව රඳවාගෙන තිබීම හෝ වත්කමක පාලනය රඳවාගෙන නොතිබෙන විට, සමාගමේ වත්කම් තුල අඛණ්ඩව ඇතුලත්වීම යම් ප්‍රමාණයක් දක්වා වත්කමක හඳුනාගනී එමනිසා, සමාගම හවුල් වගකීමක්ද හඳුනාගනී. සමාගම රඳවාගෙන තිබෙන අයිතිවාසිකම් හා බැඳියාවන් මත පදනම්ව මාරුකරන වත්කම් හා හවුල් වගකීම් මනිනු ලබයි. මාරුවන වත්කමක් මත ඇපකරු ආකෘතිය අඛණ්ඩව සම්බන්ධවීම වත්කමක සත්‍ය ධාරණ අගය හෝ සමාගම නැවත ගෙවියයුතු වටිනාකමේ උපරිම අගය යන දෙකෙන් අඩු අගයට මනිනු ලබයි.

4.7.6 හානිකරණ හදුනාගැනීම, මැණීම සහ තක්සේරු කිරීම

සෑම වාර්තාකරණ දිනයකදීම සමාගම විසින් මුල්‍ය වත්කම්වල සාධාරණ අගයට ලාභ අලාභයට ගෙන නොමැති හානිකරණ වල හරාත්මක සාක්ෂි පවතීද නැද්ද යන්න තක්සේරු කරයි. වත්කම් වල මුලික හදුනාගැනීමට පසුව අලාභ ඇතිවන අවස්ථා හටගැනීමක් හරාත්මක සාක්ෂි මඟින් ඔප්පුකරන විට සහ වත්කමක අනාගත මුදල් ගැලීමක් මත අලාභ අවස්ථාවක් ඇතිවීම සාධාරණව තක්සේරු කල හැකිවීට, මුල්‍ය වත්කමක හෝ මුල්‍ය වත්කම් සමාගමක හානිකරණයක් ඇතිවේ.

සමාගමට එකතුකල නොහැකි බවට සනාථ කර ඇති විට සමාගම විසින් ආයෝජන සුරැකුම්පත් සහ ණය අත්තිකාරම් ලියාහරිනු ලබයි.

4.8 මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ හදුනාගනු ලබන්නේ අතැති මුදල් සහ බැංකු ශේෂ වශයෙන්ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ වල, අතැති මුදල් සහ බැංකු අයිරාවේ නොගෙවු ශුද්ධ අගය අඩු කල පසු බැංකු තැන්පතු අන්තර්ගත වේ. කෙටිකාලීන කල්පිරීම් සහිත ආයෝජන, උදාහරණ වශයෙන් මාස තුනක් හෝ අත්පත්කර ගත්දින සිට මාස තුනට අඩු ආයෝජන, මුදල් සමාන දෑ ලෙස හඳුන්වයි.

4.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, හිමිකම් ලෙස වර්ගකරයි. හිමිකම් සාධන පත්‍ර, මුදලේ සාධාරණ අගයට හෝ වෙනත් වත්කම් ලැබීම හෝ ලැබිය යුතු දෑ, හිමිකම් සාධන පත්‍ර නිකුත්කිරීමේ සෘජු ශුද්ධ පිරිවැයට මනිනු ලබයි.

4.10 විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව

4.10.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික

සමාගම 1983 අංක12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික ගෙවීමට බැදී සිටී. පාරිතෝෂිකය ගෙවීමට ඇති වගකීම් අනුව අඛණ්ඩව අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ විය යුතුය. එම පනත යටතේ සමාගමේ වගකීම නිවැරදි උපකල්පන මත ගොඩනැගූ සූත්‍රය මත පදනම් වේ. එම වගකීම බාහිර අරමුදලක් ලෙස ලංකා බැංකුවේ ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ ස්ථාවර තැන්පතුවක් ලෙස පවතී. වර්ෂ අවසාන වන විට එම ස්ථාවර තැන්පතුවේ වටිනාකම රුපියල් 52,156,318.56 කි. එක් එක් වර්ෂය අවසානයේ දී තීරණය කරන ලද වගකීම් මත වාර්ෂිකව ආයෝජනය කරනු ලබන මුදල වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

4.10.2 නිශ්චිත දායක සැලසුම

නිශ්චිත දායක සැලසුමක් යනු වෙනමම ඒකකයක් තුල ස්ථිර දායකයක් ගෙවන සහ අමතර වටිනාකම් ගෙවීමට නීතිමය හෝ නිර්මාණාත්මක බැදියාවක් නොමැති පසු සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායක සැලසුම් දායකත්වය සඳහා බැදියාව හදුනාගනු ලබන්නේ සේවකයා සේවය කරන කාලයතුල, ආදායම් ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන්ය.

a. සේවක අර්ථසාධක අරමුදල

අනුමත අර්ථසාධක අරමුදලට සෑම සේවකයෙකුගේම වැටුප මත සමාගමේ හා සේවකයාගේ දායකත්වය 12% 10% වශයෙන් වේ.

b. සේවක භාරකාර අරමුදල

සමාගම විසින් සෑම සේවකයෙකුගේම වැටුප්මත **3%** ක දායකත්වයක් සේවක භාරකාර අරමුදලට යොදයි.

4.11 මූල්‍ය වගකීම්

4.11.1 මූලික හදුනාගැනීම සහ මැනීම

සමාගම මූල්‍ය වගකීම්වල එකගවීම් හෝ නිර්වචනය මත මූල්‍ය වගකීම් වර්ග කරනුයේ ලාභ හෝ අලාභ මගින් සාධාරණ වටිනාකමට ගලපනු ලබන මූල්‍ය වගකීම් හෝ වෙනත් මූල්‍ය වගකීම ලෙසය.

මූල්‍ය වගකීම්වල ගිවිසුම්ගත පාර්ශවයක් බවට සමාගම පත්වූ විට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල මූල්‍ය වගකීම් හදුනාගනී.

i ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය අනුව වාර්තාවන මූල්‍ය වගකීම (FVTPL)

සාධාරණ වටිනාකම ලාභ අලාභ මත ගලපන මූල්‍ය වගකීම තුල වෙළදාම සඳහා පවතින හෝ මූලික අවස්ථාවේ නම් කරන ලද මූල්‍ය වගකීම ඇතුලත්වේ. මූලික හදුනාගැනීමට පසුව සාධාරණ වටිනාකමට ලාභ අලාභ වල මූල්‍ය වගකීම සාධාරණ වටිනාකමට මනිනු ලබන අතර එහි වෙනස්කම් ලාභ හා අලාභ තුල හදුනාගනී.

මූලික හදුනාගැනීමේදී, අත්පත් කරගැනීමට සෘජුව දරන ගණුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ තුළ හදුනා ගනී. මූල්‍ය වගකීම්වල නියම කරන ලද මානයක් සාධාරණ වටිනාකමට ලාභ අලාභ වල මූලික අවස්ථාවේදී නියම කරන ලද මානයක් එම මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකමින් ලාභ අලාභ වලට සමාන වේ.

ii වෙනත් මූල්‍ය වගකීම

අනෙකුත් මූල්‍ය වගකීම් වල ඇතුළත් වන තැන්පතු, සමාගම විසින් නිකුත් කරන ලද ණය, ණයට ගත්තා ලද අරමුදල් මූලිකවම මිණුම් කරනු ලබන්නේ සාධාරණ අගයෙන් අත්පත් කරගැනීම සඳහා සෘජුවම ආරෝපණය වන ගණුදෙනු පිරිවැය අඩුකිරීමෙන් සහ සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුකාලීන මැනීම් මගිනි.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනුයේ සඵල පොළි අනුපාතයේ සම්පූර්ණ කොටස වන ඕනෑම වට්ටම් හෝ ප්‍රතිලාභ මත නිකුත්කළ සහ පිරිවැය ගිණුම් තුලට ගැනීමෙනි.

4.11.2 මූල්‍ය වගකීම් ප්‍රති හදුනා ගැනීම

මූල්‍ය වගකීම් ප්‍රති හදුනා ගනු ලබන්නේ බැදියාවට යටත් වගකීම නිදහස් කිරීම හෝ අවලංගුවීම හෝ කල්පැනයාම සිදුවූ විටය. පවතින මූල්‍ය වගකීමක් පසුකාලිනව වෙනත් කොන්දේසි මත එකම ණයහිමියාගෙන් වෙනත් අයෙකුට පැවරීම, හෝ පවතින වගකීම කොන්දේසි පසුකාලිනව වෙනස් කිරීම, එවැනි මාරු කිරීම් හෝ වෙනස් කිරීම, ප්‍රති හදුනාගැනීමක් ලෙස සැළකෙන අතර, එහිදී මුල් වගකීම වෙනුවට නව වගකීම මූල්‍ය ප්‍රකාශනවල හදුනාගැනේ. මුල් මූල්‍ය බැරකමේ ධාරණ අගය හා ගෙවන ලද ප්‍රතිශ්ඨාවේ අගය අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හදුනාගැනේ.

4.12 වෙන් කිරීම

වෙන්කිරීම් හදුනාගනුයේ සමාගමේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැදියාවක් (නීතිමය හෝ නිර්මාණාත්මක) පවතින විට සහ බැදියාව නිරාකරණය කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ ජනිත කරන සම්පත් පිටතට ගලායාමේ හැකියාවක් පවතින හා බැදීම විශ්වාසදායකව මැනිය හැකි විටදීය. ඕනෑම වෙන් කිරීමකට අදාල වියදම් ප්‍රතිපූර්ණයන් අඩු කළ පසු ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරයි.

4.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

LKAS 07- මුදල් ප්‍රවාහ ප්‍රකාශය, යන ප්‍රමිතයේ නියමයන් අනුකූලව වක්‍ර ක්‍රමය යොදාගනිමින් සකස් කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ වල අතැති මුදල්, බැංකු මුදල් සහ බැංකු අයිරා අඩංගු වේ.

4.14 ඛණ්ඩමය තොරතුරු

ඛණ්ඩයක් යනු සේවා සැපයීම තුළ නියැලෙන හදුනාගත හැකි අංගයන් වන අතර වෙනත් අංගයන්ගේ වෙනස්වූ අවදානම් සහ ප්‍රතිලාභවලට හිමිකම් ලබයි. වෙන් වශයෙන් හදුනාගතහැකි අංගයන් අඛණ්ඩයන් සමාගම සතුව නොමැති බැවින් සියළුම මෙහෙයුම් එක් ඛණ්ඩයක් ලෙස සලකනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සටහන්

		2017/2018	2016/2017
		රු.	රු.
5.	**ආදායම**		
	එප්පාවල පොස්පේට්	360,912,445	263,439,661
	අධි ශ්‍රේණියේ එප්පාවල පොස්පේට්	97,490,490	78,840,900
	පොල් පොහොර විකුණුම්	29,676,203	23,813,360
	යූරියා සහ එම්.ඕ.පී.	5,472,100	-
		493,551,238	366,093,921
6.	**අනෙකුත් ආදායම්**		
	ණය හා ලැබිය යුතු දෑ		
	පොළී ආදායම	50,950,767	45,880,356
	විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වර්ගය		
	ලාභාංශ ආදායම	800,000	200,000
	විවිධ ආදායම්	112,604	2,787,892
		51,863,371	48,868,248
7.	**මෙහෙයුම් වලින් ලද ලාභය පහත අයිතම අඩුකල පසු දක්වා ඇත**		
	කාර්ය මණ්ඩල පිරිවැය	230,782,595	224,677,744
	අධ්‍යක්ෂ ගාස්තු	401,950	493,350
	අධ්‍යක්ෂ වියදම්	-	-
	ක්ෂයවීම	33,660,940	30,463,614
	විගණන ගාස්තු	100,000	-
	විශ්‍රාම ප්‍රතිලාභ	7,637,671	8,207,172
8.	**ආදායම් බදු**		
	වර්ෂයේ ලාභ මත ආදායම් බද්ද	13,373,636	977,072
	විලම්භිත බදු	-	(22,450,992)
		13,373,636	(21,473,920)
8.1	**ආදායම් බදු වියදම් සැසදීම**		
	බදු වලට පෙර ලාභය	38,679,281	(32,007,850)
	වෙළඳ නොවන ආදායම්	(51,863,371)	(46,677,075)
	ඉඩ නොදෙන වියදම් එකතුව	49,241,519	36,249,643
	ඉඩ දෙන වියදම් එකතුව	(40,045,210)	(50,491,635)
	පොළී ආදායම්/ස්ථාවර වත්කම් ඉවත්කිරීමේ ලාභය	51,750,768	48,797,271
	සුදුසුකම්ලත් ගෙවීම්	-	(45,939,260)
	බදු අය කළ හැකි ලාභය / (අලාභය)	47,762,986	(90,068,906)
	ආදායම් බද්ද 28%	13,373,636	-
	නාමමාත්‍රික බදු බැර	-	(58,905)
	පසුගිය වසර සඳහා ඌණ/(අධි) වෙන්කිරීම	-	1,035,977
		13,373,636	977,072

9. කොටසක ඉපැයුම/(අලාභය)

කොටසක සාමාන්‍ය ඉපයුම/(අලාභය) ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස් කරුවන්ට බෙදාහැරිය හැකි ලාභය/(අලාභය), වර්ෂය තුළ බරතැබූ සාමාන්‍ය කොටස්වල එකතුවෙන් බෙදීමෙන්ය.

සාමාන්‍ය කොටස්කරුවන්ට බෙදා හැරිය හැකි ශුද්ධ ලාභය/(අලාභය)	25,305,645.13	(10,533,931)
වර්ෂය තුල වූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණන	7,251,000	7,251,000
කොටසක මූලික ඉපැයුම/(අලාභය)	**3.49**	**(1.45)**

10. දේපළ, පිරියත හා උපකරණ

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

10 දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය	2017 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතුකිරීම්	ඉවත් කිරීම්	2018 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	172,743,345.77			172,743,345.77
අභ්‍යන්තර මාර්ග	65,139,730.22			65,139,730.22
යන්ත්‍ර හා පිරියත	138,802,269.39			138,802,269.39
මොටර් වාහන	98,753,161.00			98,753,161.00
කාර්යාල උපකරණ	2,343,739.00	237,660		2,581,399.00
විදුලි උපකරණ	13,335,586.65	11,321		13,346,907.65
ලීබඩු හා සවිකිරීම්	7,432,798.79	185,585		7,618,383.79
රසායනාගාර උපකරණ	407,463.00	1,568,830		1,976,293.00
පරිගණක දෘඩාංග හා මෘදුකාංග	14,113,849.10	715,149		14,828,998.30
විවිධ වත්කම්	11,283,522.01	-		11,283,522.01
	524,355,464.93	**2,718,545.20**	-	**527,074,010.13**

ක්ෂයවීම්	2017 අප්‍රේල් 01 දිනට ශේෂය	වර්ෂය සදහා අයකිරීම්	මාරුකිරීම්	2018 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	35,034,791.47	6,482,058		41,516,849.41
අභ්‍යන්තර මාර්ග	9,627,178.81	3,256,986		12,884,165.30
යන්ත්‍ර හා පිරියත	42,142,100.23	10,230,200		52,372,300.45
මොටර් වාහන	70,916,030.87	9,539,321		80,455,352.20
කාර්යාල උපකරණ	2,071,812.96	106,325		2,178,137.63
විදුලි උපකරණ	6,362,218.06	1,162,925		7,525,142.72
ලීබඩු හා සවිකිරීම්	5,077,517.52	824,403		5,901,920.99
රසායනාගාර උපකරණ	407,463.26	-		407,463.26
පරිගණක දෘඩාංග හා මෘදුකාංග	12,844,945.81	722,198		13,567,143.87
විවිධ වත්කම්	9,278,866.21	1,336,523		10,615,389.25
	193,762,925.20	**33,660,940**	-	**227,423,865.08**
ලියා හල අගය	**330,592,540**			**299,650,145**

ප්‍රාග්ධනය නොනිමි වැඩ	2017 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතුකිරීම්	පැවරීම	2018 මාර්තු 31 දිනට ශේෂය
ස්ථාපනය කරන ලද අලුත් කර්මාන්ත ශලාව	7,440,000.00			7,440,000.00
	7,440,000.00			**7,440,000.00**
එකතුව	**338,032,540**			**307,090,145**
අපහායනයට වෙන්කිරීම	**(9,742,686.84)**	**(2,302,686.84)**		**(12,045,373.68)**
	328,289,852.89			**295,044,771.37**

	Holding %	31.03.2018 රුපියල්	31.03.2017 රුපියල්
11.0			
කොටස් ආයෝජන			
ජී.එස්.එම්.බී.ටෙක්නිකල් සර්විස් සමාගමේ ආයෝජන			
රුපියල් 10 බැගින් වූ කොටස් **100,000**	17%	1,000,000	1,000,000

ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විස් සමාගම ලැයිස්තුගත සමාගමක් නොවන බැවින් ආයෝජනවල සාධාරණ අගයක් ලබාගත නොහැක. එමනිසා කළමනාකරණය විසින් අදාල ආයෝජනය එම සමාගමට ආවේනික වූ ව්‍යාපාර කටයුතුද සැලකිල්ලට ගෙන පිරිවැයට වාර්තා කරයි. තවද කළමනාකරනයට අදාල ආයෝජනය විකුණා ලාභ ලැබීමේ අදහසක්ද නොපවතී.

		2017/2018 රුපියල්	2016/2017 රුපියල්
12.0			
තොග			
වෙළඳ තොග -	එප්පාවල අවසාන නිමි තොග	23,706,482	20,965,642
	උපලබ්ධි නොවු ලාභය සඳහා වෙන් කිරීම්	(460,887)	(369,252)
	අමුද්‍රව්‍ය තොග	11,777,438	11,324,197
සාමාන්‍ය තොග		71,035,577	81,109,489
නොනිමි වැඩ පිරිවැයෙන් මාරු කරන ලද අමතර කොටස් තොගය		-	-
වෙළඳ තොගය - වාරියපොළ		5,523,274	5,560,798
		111,581,884	118,590,873
අඩුකළා :			
සාමාන්‍ය තොග සඳහා හානිකරණය		(3,808,331)	(1,435,732)
		107,773,553	117,155,141

13.0

තැන්පතු, කලින් ගෙවීම හා වෙනත් ලැබිය යුතු දෑ

සේවක ණය සහ අත්තිකාරම්	135,965,009	112,752,235
ස්ථාවර තැන්පතු පොළී ආදායම	10,840,653	-
තැන්පතු සහ ඉදිරියට ගෙවීම්	2,650,156	2,323,574
රිපෝ පොළී ආදායම	24,527	-
	149,480,346	115,075.809

14.0

කෙටිකාලීන තැන්පතු

ස්ථාවර තැන්පතු		
මහජන බැංකුව	89,044,549	76,489,291
ලංකා බැංකුව	127,332,591	120,834,777
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	20,361,719	19,231,824
	236,738,859	216,555,892

15.0
මුදල් සහ මුදල් සමාන දෑ

	31.03.2018 රුපියල්	31.03.2017 රුපියල්
රිපෝ - ලංකා බැංකුව	22,000,000	7,000,000
මුද්දර සංචිතය	14,000	13,232
බැංකුවේ ඇති මුදල්	11,695,527	14,281,531
අතැති මුදල්	121,000	121,000
	33,830,527	21,415,763

16.0
ප්‍රකාශිත ප්‍රාග්ධනය

නිකුත් කල සහ සම්පූර්ණයෙන් ගෙවන ලද	72,510,000	72,510,000
නිකුත් කල කොටස් ගණන	7,251,000	7,251,000

17.0
විශ්‍රාමික පාරිතෝෂික බැදීම

	31.03.2018 රුපියල්	31.03.2017 රුපියල්
වර්ෂයේ ආරම්භක ශේෂය	31,217,517	29,712,137
ප්‍රවර්ථන සේවා පිරිවැය	2,301,017	1,830,397
පොළී වියදම	3,490,118	3,838,808
	37,008,652	35,381,343
වර්ෂය තුළ ගෙවීම	(7,637,671)	(8,207,172)
ආයුගණක (ලාභ)/අලාභ	7,695,396	4,043,346
වර්ෂය අවසාන ශේෂය	37,066,377	31,217,517

පාරිතෝෂික වගකීම් ගණනයේදී පහත උපකල්පනයන් පදනම් කොටගෙන ඇත

අපේක්ෂිත සාමාන්‍ය වාර්ෂික වේතන වැඩිවීම්	3%	3%
වට්ටම් ප්‍රතිශතය	11.2%	12.9%

18.0
විලම්භිත බදු

වර්ෂය ආරම්භක ශේෂය	9,048,249	31,499,241
වර්ෂය තුළ වෙනස්වීම	-	(22,450,992)
වර්ෂය අවසාන ශේෂය	9,048,249	9,048,249

19.0
ආදායම් බදු

වර්ෂය ආරම්භක ශේෂය	(3,112,076)	4,174,833
වර්ෂය සඳහා වෙන්කිරීම්	13,373,636	957,073
වර්ෂය තුළ ගෙවීම්	(3,609,129)	(6,592,637)
රඳවා ගැනීමේ බදු	(1,777,058)	(1,651,345)
වර්ෂය අවසාන ශේෂය	4,875,373	(3,112,076)

20.0

අනිකුත් ගෙවිය යුතු හා උපචිත වියදම්

උපචිත වියදම්	20,207,839	15,062,235
අනෙකුත් ගෙවිය යුතු දෑ	5,147,172	4,331,783
ස්ථාවර තැන්පතු මත බැංකු ණය	-	24,979,533
	25,355,010	44,373,550

21.0

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්

21.1

වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන අයිතමයන්ගේ ශේෂය

රිපෝ ලංකා බැංකුව	7,000,000	25,000,000
මුද්දර සංචිතය	13,232	7,151
බැංකුවේ මුදල්	14,281,531	2,542,623
අතැති මුදල්	121,000	120,000
	21,415,763	27,669,774

21.2

වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන අයිතමයන්ගේ ශේෂය

	31.03.2018 රුපියල්	31.03.2017 රුපියල්
රිපෝ - ලංකා බැංකුව	22,000,000	7,000,000
මුද්දර සංචිතය	14,000	13,232
බැංකුවේ මුදල්	11,695,527	14,281,531
අතැති මුදල්	121,000	121,000
	33,830,527	21,415,763

22.0

මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම

මූල්‍ය වත්කම්		
බැංකු මුදල් හා අත ඉතිරි මුදල්	11,830,527	14,415,763
ණය හා ලැබිය යුතු දෑ		
වෙළඳ ලැබිය යුතු	19,053,326	36,455,805
සේවක ණය සහ අත්තිකාරම්	113,654,155	90,732,291
කෙටි කාලීන තැන්පතු	236,738,858	216,555,893
විකිණීම සඳහා පවතින		
කොටස් ආයෝජන	1,000,000	1,000,000
මූල්‍ය වගකීම්		
අනිකුත් මූල්‍ය වගකීම්		
උපචිත වියදම් හා අනෙකුත් ගෙවියයුතු දෑ	25,355,010	44,373,550
වෙළඳ ගෙවිය යුතු	11,393,570	13,848,472

23.0 මූල්‍ය අවදානම කළමනාකරණය

වෙළඳපොළ අවදානම් (මුදල් අවදානම පොළී අනුපාත අවදානම සහ මිල මට්ටම් අවදානම් ඇතුලත්ව) ණය අවදානම, ද්‍රවශීල අවදානම් ආදී විවිධාකාර වූ මූල්‍ය අවදානම් වලට සමාගම භාජනය වේ. සමාගමක සමස්ථ අවදානම් කළමනාකරන ක්‍රියාවලිය අවිනිශ්චිත මූල්‍ය අවදානම මත පදනම් වී ඇති අතර සමාගමෙහි මූල්‍ය ක්‍රියාකාරිත්වය මත ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල අවම කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කරනු ලබයි.

සමාගමේ මූලික මූල්‍ය උපකරණ කෙටිකාලීන තැන්පතු, මුදල් වෙළඳපොළ ආයෝජන, සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාවය වැඩි කිරීම හා පවත්වාගෙන යාම සහ සමාගමේ මූල්‍ය සංචිත මත වූ ප්‍රතිලාභ උපරිම කිරීම වේ. වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු ආදී වූ ව්‍යාපාර කටයුතු වලින් සෘජුව ඇති වූ මූල්‍ය උපකරණ ද සමාගම සතුව ඇත.

(a) මූල්‍ය අවදානම

මූල්‍ය වත්කම්වල තත්ත්වය (ගුණය) හෝ හානිකරණයක් නොමැතිව තක්සේරු කලහැකි වනුයේ බාහිර ණය අනුපාත (තිබේ නම්) වලට හෝ ප්‍රතිවිරුද්ධ පැහැර හැරීමේ අනුපාත පිළිබඳ අතීත තොරතුරු වලට අනුකූලවය. ණය අවදානම හටගනු ලබනුයේ මුදල් හා මුදල් සමාන දෑ සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගෙන් ලැබීමට ඇති ණය හිඟ ලැබිය යුතු දෑ සහ ඒ හා බැඳුනු ගනුදෙනු ඇතුලත්වය.

(b) වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ තුල අන්තර්ගත වී ඇත්තේ දේශීය ගනුදෙනුකරුවන්ය. ඉදිරියට කරගෙන යන ණය අගය කිරීම (විනිශ්චය කිරීම්) ක්‍රියාත්මක කරනුයේ මූල්‍ය ගිණුම් ලැබිය යුතු දෑ කොන්දේසි මතය. එක් ප්‍රතිවිරුද්ධ පාර්ශවයක් හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශව කණ්ඩායමක් පිළිබඳව සැළකිය යුතු ණය අවදානමක් සමාගම සතුව නැත. සමාගමක් ණය කොන්දේසි අනුමත කිරීමට ප්‍රථම පාරිභෝගිකයා ඇගයීමට ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිහිටුවාගෙන ඇත.

(c) ද්‍රවශීල අවධානම

මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම කරනු ලබන්නේ මූල්‍ය අංශය විසිනි. මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් පවතීද යන්න තහවුරු කර ගැනීමට පුරෝකථනය කල සමාගමක ද්‍රවශීලතා නියමයන්ගේ හැසිරීම මූල්‍ය අංශය අධීක්ෂණය කරයි. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා ඇති අතිරික්ත මුදල් ඉහත සඳහන් ශේෂය බැංකු තැන්පතුවල ආයෝජනය කර ඇත. වාර්තාකරන දිනයේදී සමාගම සතුව තැන්පතු රුපියල් 236,738,858 (2017.03.31 රු. 216,555,893) පැවතීය. එය ද්‍රවශීලතා අවධානම් කළමනාකරණය කිරීමෙහිලා පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කර ගැනීමට අපේක්ෂා කරන ලදී.

(d) පොළී අනුපාත අවදානම

සමාගම සතුව මුදල් හා රාජ්‍ය හා ණය ගෙවීමට හැකි බැංකුවල, මුදල් හා බැංකු ශේෂ ඇත. ප්‍රතිලාභ වක්‍ර හැසිරීම සහ පොළී අනුපාත චලනයන් ක්‍රීයාකාරීව අධීක්ෂණය කිරීමෙන් සමාගමට පොළී අනුපාත අවධානම පාලනය කල හැක.

(e) ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයෙහිලා සමාගමේ අරමුණ වනුයේ කොටස් හිමියන්ට සහ අනිකුත් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගැනීම තුළින් අඛණ්ඩ පැවැත්මේ හැකියාව ආරාක්ෂා කරගැනීම වේ.

24.0 අසම්භාව්‍ය වත්කම් / අසම්භාව්‍ය වගකීම්

පහත දැක්වෙන වියදමට තිබෙන තත්ත්වයන්වල ප්‍රතිඵලය හැර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට ප්‍රමාණාත්මක අසම්භාව්‍ය වත්කම් වගකීම් සමාගම සතුව නැත.

25.0 බැඳීම

25.1 මූල්‍ය බැඳීම්

මූල්‍ය තත්ත්ව වාර්තා කරන දින අවසානයේදී ප්‍රමාණාත්මක මූල්‍ය බැඳීම් නැත.

25.2 ප්‍රාග්ධන මූල්‍ය බැඳීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනට ප්‍රාග්ධන වියදම් පවතී. නමුත් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගෙන නැත. ඒවා පහත පරිදිවේ.

	31.03.2018 රුපියල්	31.03.2017 රුපියල්
අලුත් කුඩුකරන යන්ත්‍රය සඳහා නොගෙවන ලද ප්‍රාග්ධන වියදම්	4,512,858	4,386,358

25.3 නීතිමය බැඳීම්

නඩු අංක, LPL/COU/03-1 සහ LPL/COU/03-02 දරණ අංක යටතේ අනතුරක් සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයක් විසින් රු. මිලියන 2.5 අලාභයක් ඉල්ලා නඩු පවරා ඇත.

25.4 මූල්‍ය වාර්තාකරණ දිනට පසුව

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය කිසිදු අවස්ථාවක් ඇතිවී නොමැත.

26.0 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

26.1 ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සමඟ සිදුවෙන ගණුදෙනු

සමාගමේ කටයුතු සැලසුම් කිරීම අධ්‍යක්ෂණය හා පාලනය සඳහා බලය හා වගකිම ඇති පුද්ගලයින් සම්බන්ධිත පාර්ශවයන්ට අයත්වන ප්‍රධාන කළමනාකරණ නිළධාරින් වේ. ප්‍රධාන කළමනාකරන නිළධාරීන්ට ව්‍යාපාරයේ අධ්‍යක්ෂකවරු ද ඇතුලත්වේ. අවුරුද්ද සඳහා ප්‍රධාන කළමනාකරුවන්ට ගෙවන වේතනය පහත දක්වේ.

	31.03.2018 රුපියල්	31.03.2017 රුපියල්
කෙටිකාලීන ප්‍රතිලාභ	4,334,542	3,863,991

26.2 අනෙතුත් සම්බන්ධිත පාර්ශව සමග සිදු වූ ගණුදෙනු

මූල්‍ය වර්ෂය තුළ LKAS 24 යටතේ වෙනත් සම්බන්ධිත පාර්ශව ලෙස හඳුනාගත් ගණුදෙනු ක්‍රියාකාරකම් කිසිවක් නැත

මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය

2017/2018 වසර සඳහා මෙහෙයුම් සහ මෙහෙයුම් ප්‍රතිඵල මෙන්ම ආයතනයේ අනාගත සැලසුම් පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේශනයක් පහතින් දැක්වේ.

01 <u>ලාභ ලැබීමේ හැකියාව</u>

සමාගම වසරකට රු. මිලියන 38.68 ක බදු පෙර ලාභයක් වාර්තා කලේය. ගිය වසරේදී එම බදු පෙර අලාභය රු.මිලියන 32 ක් විය. එමනිසා, එය පසුගිය වසර සමග සැසඳීමේදී සතුටුදායක වර්ධනයක් වේ. අසාමාන්‍ය කාලගුණික රටාව, නියගය, අස්ථායි පොහොර යෙදීමේ ප්‍රතිපත්තිය, ආධාර පොහොර සඳහා අධික පිරිවැය, ඉහළ OHS, මත ව්‍යාපාරයේ ලාභය තීරණය වේ.



	10/11	11/12	12/13	13/14	14/15	15/16	16/17	17/18
බදු පෙර ලාභය	126	203	137	171.575	117.86	60.89	(32.01)	38.67

02 <u>ශුද්ධ වත්කම</u>

පසුගිය වසර අගය වූ රු.මිලියන 740.30 සිට මෙම වර්ෂය අවසාන වන විට සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.මිලියන 775.35 දක්වා ඉහළ ගොස් තිබේ.



	10/11	11/12	12/13	13/14	14/15	15/16	16/17	17/18
ශුද්ධ වත්කම්	411.94	534.70	587.90	694.56	760.73	760.31	740.73	755.35

03 ආදායම

2017/2018 මූල්‍ය වර්ෂයේ දළ පිරිවැටුම රු.මිලියන 493.55 ක් වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම වසර තුළ සමාගම එප්පාවල රොක් පොස්පේට් (ERP) සඳහා මෙට්‍රික් ටොන් 37,760.80 ට සමාන විකුණුම් ප්‍රමාණයකුත්, ඉහළ ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) මෙට්‍රික් ටොන් 8,888.96 ක් හා පොල් පොහොර මෙට්‍රික් ටොන් 576.12 ක විකුණුම් ප්‍රමාණයකුත් වාර්තා කර ඇත.





ප්‍රාග්ධන වියදම්

පසුගිය වසර පහ සඳහා ප්‍රාග්ධන වියදම් පහත පරිදි වේ.

අත්පත් කරගැනීම් සහ නොනිමි ප්‍රාග්ධන වැඩ

වසර	වටිනාකම (රු.)
2013/14	134,001,412.00
2014/15	121,097,086.38
2015/16	53,251,881.57
2016/17	9,274,995.81
2017/18	2,718,545.20

වසර තුළ අත්දකින්නාවූ අස්ථාවරත්වය නිසා ඇතිවන අහිතකර මුදල් ප්‍රවාහය හේතුවෙන් ආයතනය විසින් ප්‍රාග්ධන වත්කම් හෝ වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ආයෝජනය කර නැත.

04 භාණ්ඩාගාරයට (ලාභාංශ) හා රාජ්‍ය ආයතන සඳහා ගෙවීම්

සමාගමේ එකම කොටස්කරුවා මහා භාණ්ඩාගාරයවේ. පවත්නා 2016/2017 වර්ෂය සඳහා ප්‍රකාශිත ලාභාංශ රු.මි. 3 ක් වන අතර, පවත්නා වර්ෂයේ ලාභාංශ සමාගමේ ඉදිරි ලාභය හා මුදල් ප්‍රවාහයන් සැළකිල්ලට ගනිමින් ඉදිරි වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුමත කරනු ලැබේ.

ප්‍රධාන කළමනාකරු

රැස්වීම් පිළිබඳ දැනුම්දීම

සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2018 සැප්තැම්බර් මස 20 වන දින පස්වරු 3.30 ට කොළඹ 14, නව කැළණිපාලම පාර, අංක 73 1/1 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේදී පහත කාරණා සඳහා පවත්වන බව කොටස්කරුවන්ට මෙයින් දැනුම් දෙමි.

1. 2017 සැප්තැම්බර් මස 26 දිනැති වාර්ෂික මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තා අනුමත කිරීම
2. මේ සමග එවන 2018.03.31 න් අවසන් වූ වසර සඳහා ගිණුම් විගණන ගිණුම් ප්‍රකාශය හා 2018.03.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා විගණකාධිවරුන්ගේ වාර්තාව ලැබීම, සළකා බැලීම හා අනුමාන කිරීම.
3. මේ සමහ එවනු ලබන වාර්ෂික වාර්තාව ලැබීමට සහ අනුමත කිරීම.
4. මහා භාණ්ඩාගාරයට සමාගමේ එකම කොටස්කරු ලෙස 2017/2018 වර්ෂය සඳහා ලාභාංශ බෙදා හැරීම අනුමත කිරීම
5. සමාගම් ව්‍යවස්ථාවලියේ අංක 92 සහ 93 අනුව (වාර්ෂික මහා සභා රැස්වීමේදී) ඉවත්ව යන අධ්‍යක්ෂවරු සමාගම් ව්‍යවස්ථාවලියේ වගන්ති 94 අනුව නැවත පත්කිරීමට සුදුසු අය සඳහා යළි යෝජනා ඉදිරිපත් කිරීම.
6. 2018/2019 වර්ෂය සඳහා විගණකවරු පත්කිරීමට සහ අවුරුද්ද සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂිකය තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට බලය පැවරීම.
7. දැනුම් දී ඇති අනෙකුත් දේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත

සී/ස ෆයිනෑන්ෂල් සර්විස් සහ කොමර්ෂල් ඒජන්සීස් (පුද්ගලික) සමාගම

සී/ස ලංකා පොස්පේට් සමාගමේ ලේකම්වරුන්

සටහන්

මහා සභා රැස්වීමේදී කොටස්කරුවෙකුට ඔහු වෙනුවෙන් ඡන්දය දීමට, ඔහු/ඇය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කිරීමට සහ පැමිණීමට ප්‍රතියුක්තකයෙකු පත් කිරීමට හිමිකම් තිබේ. ප්‍රතියුක්තකයා සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නැත. මෙම අරමුණ සඳහා ආකෘති පත්‍රය අමුණා ඇත

පෙරකලාසියේ ආකෘතිය

සී/ස ලංකා පොස්පේට් සමාගම

බ ල ප ත්‍ර ය

....පදිංචි...
වන, මම/අපි ඉහත සඳහන් සමාගමේ සාමාජිකයෙකු වීම හේතුවෙන් .... පදිංචි ....හෝ ඔහු/ඇය අසමත් වුවහොත් .... පදිංචි .... යන අය මගේ/අපගේ බලය ලත් නියෝජිතයා වශයෙන් 2018 සැප්තැම්බර් මස 20 වන දින සමාගමේ පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී සහ යම් කල් තැබීමකදීද එයට ප්‍රතිඵලයක් වශයෙන් පැවැත්වෙන සෑම ඡන්ද රැස්වීමකදීම, අප/මා වෙනුවෙන් ඡන්දය දීමට මෙයින් පත් කරමි/කරමු.

2017 ....මස.........................දිනයේදී අත්සන් කරන ලදී.

……………………………..

අත්සන

<u>සටහන</u>

නියෝජිතයාට ඔහුට සුදුසු යයි සිතෙන පරිදි රැස්වීමකදී ඉදිරියට ගෙනෙන ලද ඕනෑම යෝජනාවකට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිය

නියෝජිතයා සමාගමේ සාමාජිකයෙකුවීම අවශ්‍ය නැත.

සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් මෙහි පිටුපස සටහන් කොට ඇත.